පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය සභාව
-----------------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 17 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් ප්‍රවර්ථන වර්ෂයේ රු.7,397,636 ක් වටිනාකමින් යුතු ගොඩනැගිලි ඉදිකර ඇතත් එය රු.6,976,315 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමෙන් වත්කම් රු.421,321 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රවර්ථන වර්ෂය සඳහා රු.125,850 ක් වූ හිඟ හිටි වෙළඳ බලපත්‍ර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය නොවන සංවිධානයක් විසින් 2015 වර්ෂයේ දී ප්‍රාදේශීය සභාවට පවරාදුන් රු. 4,385,000 ක් වටිනා බස් රථය ප්‍රාග්ධනිත ගත කර නොතිබුණි.

(ඈ) සභාව සතුව පවතින ට්‍රැක්ටර් රථ දෙකක හා යතුරුපැදියක වටිනාකම් තක්සේරු කොට ප්‍රාග්ධනිත ගත කර නොතිබුණි.

1.3.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

නීති, රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1989 අප්‍රේල් 17 දින අංක 554/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව 141,143 හා 145 යන රීතින් | තැන්පතු ලේඛනය පවත්වාගෙන යාම හා ගනුදෙනු සටහන් කිරීම එක් එක් තැන්පතු වර්ගය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ගිණුම් ආරම්භ කිරීම හා වර්ෂ අවසානයේ දී තැන්පතු පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයක් සකස් කිරීම යනාදී කටයුතු සිදු කර නොතිබුණි. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 09 ක ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 321,380 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,598,815 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,277,435 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 50 | - | - | - | 50 | - | - | - |
| කුලී | 1,100 | 1,083 | 1,110 | 96 | 1,062 | 1,109 | 1,088 | 123 |
| බලපත්‍ර ගාස්තු | 478 | 457 | 472 | - | 349 | 289 | 324 | 15 |
| වෙනත් ආදායම් | 11,320 | 11,372 | 11,049 | 931 | 8,461 | 12,370 | 9,704 | 3,500 |

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කාර්යය සාධනය
--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
-------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විට කාරණා 13 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම
----------------------

2017 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) පාරිසරික ගැටළු
--------------------

පරිසර බලපත්‍ර නිකුත් කිරීම
--------------------------------

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පාරිසරික හානි සිදු වන වී මෝල්, වඩු කර්මාන්ත, ගරාජ් සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන ආයතන ආදී ව්‍යවසායන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත් සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන එවැනි ව්‍යවසායන් 42 ක් එම බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කර්මාන්තය කරගෙන යමින් තිබුණි. මේ සම්බන්ධයෙන් ඇති විය හැකි පාරිසරික ගැටළු නිරාකරණය කිරීමට සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

සභාව විසින් තිරසර සංවර්ධන ඉලක්කයක් ලෙස පරිසරය සුරැකීම කෙරෙහි අවධානය යොමු කර තිබූ අතර අදාළ කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙල හා ඒ සම්බන්ධ නිර්ණායක හඳුනා ගෙන නොතිබුණි.

## 3.2. මානව සම්පත් කළමනාකරණය

### 3.2.1 සේවක පුරප්පාඩු

2014 වර්ෂයේ සිට තාක්ෂණික නිලධාරී, පුස්තකාලයාධිපති, විදුලි කාර්මික නිලධාරී සහ රියදුරු යන තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට 2018 ජුනි 13 දින වන විටද කටයුතු කර නොතිබුණි.

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 පවරා නොගත් වත්කම්

සභාව විසින් රජයට අයත් ඉඩම්වල රු.109,659,700 ක් වටිනා ගොඩනැගිලි 2017 දෙසැම්බර් 31 වන විට ඉදිකර තිබුණි. එමෙන්ම පළාත් පාලන ආයතනවල ප්‍රවාහන පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් සභාවට වාහන 03 ක් ලබා දී තිබුණි. එම ඉඩම්වල හා වාහනවල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

### 3.3.2 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

විස්තර පහත පරිදි විය.

(අ) ප්‍රාදේශීය සභාව විසින් 2015 ජනවාරි 27 වන දින රු. 485,000 ක මුදලක් වැයකර ජල සාම්පල් පරීක්ෂණ කට්ටලයක් හා ජල පෙරන දෙකක් මිලදී ගෙන තිබුණු නමුත් එම ජල සාම්පල් පරීක්ෂා කිරීමට තාක්ෂණික දැනුමැති නිලධාරියෙකු නොමැතිවීම හේතුවෙන් එම උපකරණ කට්ටල මිලදීගත් දින සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) පළාත් පාලන හා පලාත් සභා අමාත්‍යාංශ මඟින් 2006 වර්ෂයේ සභාවට ලබා දී තිබූ කැබ් රථය 2015 වර්ෂයේ සිට ක්‍රියා විරහිතව වාහන අංගනයේ ගාල්කර තිබුණ අතර, එය අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2018 ජුනි 13 දින වන විටද ගෙන නොතිබුණි.

### 3.3.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

සමාලෝචිත වර්ෂය සඳහා 2018 මැයි 29 දින පැවැත්වූ භාණ්ඩ සමීක්ෂණය අනුව විනාශ කළ යුතු සහ අළුත්වැඩියා කළයුතු භාණ්ඩ සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර තිබූ නිර්දේශයන් 2018 ජුනි 13 වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.4 ප්‍රසම්පාදනය

### 3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 ට අනුව 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන -2017 යටතේ ලස්සනගම පානීය ජල යෝජනා ක්‍රමය මඟින් අමතර ළිඳක් සහ ජල පොම්පාගාරයක් සහිතව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වටිනාකම රු.1,287,804 ක් වූ කොන්ත්‍රාත්තුවක් 2017 ඔක්තෝබර් 09 වන දින ප්‍රජා සංවිධානයක් වෙත ප්‍රදානය කර තිබූ අතර ප්‍රජා සංවිධානය විසින් වටිනාකම රු.287,822 ක් වන වැඩවිෂයන් 04 ක් 2018 ජුනි 12 දින වන විටද ඉටු කර නොතිබූ අතර සභාව විසින් එම කාර්යයන් නිසි පරිදි ඉටු කර ඇති බවට සහතික කරමින් බිල්පත්‍ර පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණි.

(ආ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන-2017 යටතේ යාය 11 පානීය ජල යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා වටිනාකම රු.3,061,716 ක කොන්ත්‍රාත්තුවක් 2017 නොවැම්බර් 01 දින ප්‍රදානය කර තිබූ අතර මෙහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 21 ක කාලයක් ලබාදිය යුතු වුවද සභාව විසින් ඒ සඳහා දින 14 ක් ලබා දී තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 ප්‍රකාරව පුළුල් ප්‍රචාරයක් ලබා දිය යුතු වුවද සභා බල ප්‍රදේශයේ දැන්වීම් පල කිරීම පමණක් සිදු කර තිබුණි. මේ හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබූ අතර එහිදී අවම ලංසුකරු ඇස්තමේන්තු වටිනාකමට වඩා 15% වැඩියෙන් ලංසු ඉදිරිපත් කර තිබුණි. මේ හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ දී රු.398,930 ක පාඩුවක් සිදුව තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අරමුණු වූ 1.2.1 (අ) සහ (ඇ) ඉටු වී නොතිබුණි. තවද කොන්ත්‍රාත්කරු විසින් වටිනාකම රු.237,000 ක් වූ ඇළුමිනියම් ඉනිමඟක් සවිකිරීම, කරාමයක් සවිකිරීම, ක්ලෝරීන් පද්ධතිය සකස් කිරීම හා පරීක්ෂා කිරීමේ කාර්යයන් ඉටු කිරීමට 2018 ජුනි 13 දින වන විටද කටයුතු කර නොතිබුණි. එමෙන්ම ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාතුවේ වැඩ 2017 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතු වුවද කොන්ත්‍රාත්තුව 2018 ජුනි 12 දින වන විටද නිම කර නොතිබුණි. මේ අනුව අයකළ යුතුව තිබූ ප්‍රමාද ගාස්තු වන රු.251,064 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන - 2017 යටතේ ඉදිකිරීම් සඳහා රු.1,805,858 ක වටිනාකමින් යුතු කොන්ත්‍රාත් ගිවිසුම් 02 ක් 2017 ඔක්තෝම්බර් 09 දින අත්සන් කර ඇතත් අදාළ වැඩ කටයුතු 2018 ජුනි 13 වන විටද ආරම්භ කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

---------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම හා වියදම සහ තත්‍ය ආදායම හා වියදම අතර සියයට 2 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | වත්කම් ගිණුම්ගත කිරීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | i. චක්‍රලේඛ අනුව වැඩ ඉටු කිරීම.<br>ii. කොන්ත්‍රාත් බදු මුදල් ගෙවීම . |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | සේවක පුරප්පාඩු පිරවීම. |